සැ. යු. - 2017.03.10 වැනි දින පළ වූ අංක 2010 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවී ය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,011 - 2017 මාර්තු මස 17 වැනි සිකුරාදා - 2017.03.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — | වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — | පිස්කල් විකිණීම ... ... ... | 278 |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — | බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — | නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 284 |
| | | විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරින්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මාර්තු මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 අප්‍රේල් මස 07 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මාර්තු මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


277- B 081152 — 353 (2017/03)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

ගම්පහ දිසා අධිකරණයේ දී ය

එම්. ඩී. ජෙනට් පෙරේරා,
අංක 3 බී 6,
''ඉවැන්ජලෝ''
සිළුමිණ මාවත, එඬේරමුල්ල, වත්තල.

අංකය : 41711/මුදල්
ඇස්කීසි අංකය : 97/2010
හෙවත්

.......................................*පැමිණිලිකාරිය.*

*එදිරිව*

අබ්දුල් ලතීෆ් බසුර්ඩීන් අහමඩ්
ඒ. එල්. බී. රහුමාන්,
අංක 142/ඒ/1,
සිළුමිණ මාවත, එඬේරමුල්ල, වත්තල.

..................................................*විත්තිකරු.*

මෙම නඩුවේ වාර්තාගත කර ඇති වර්ෂ 2009.06.16 වැනි දින දරන තීන්දු ප්‍රකාශය පරිදි විත්තිකරු විසින් පැමිණිලිකාරියට ගෙවිය යුතු රුපියල් අනූ දහස (රු.90,000) ක අලාභ මුදල සහ මෙම නඩුවේ නඩු ගාස්තු ද වශයෙන්, අධිකරණය විසින් 2016.01.01 දින දක්වා තක්සේරු කර ඇති රු. 549,160 ක මුදල ද, එදින සිට එකී රු. 90,000 ක මුදල ගෙවන තෙක් හෝ නඩුවට අදාළ බැම්ම ඉදි කරන තෙක් මසකට රු. 2,000 බැගින් වූ අලාභ මුදල ද, ගෙවීම විත්තිකරු විසින් පැහැර හැර ඇති හෙයින් එම මුදල් සහ වෙන්දේසි ගාස්තු ද විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහා තහනමට ගන්නා ලද පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපල වර්ෂ 2017 ක් වූ අප්‍රේල් මස 27 වෙනි දින පස්වරු 2.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ, එඬේරමුල්ල පින්නමැද පිහිටා ඇති එඬේරමුල්ල එස්ටේට් නම් ඉඩමට ටී. පී. ඩී. ඩබ්ලිව් නානායක්කාර මිනුම්පති විසින් මැන සාදන ලද අංක 45/56 සහ 1996.08.30 දිනැති පිඹුර ප්‍රකාර ලොට් අංක 26 A දරන ඉඩමට මායිම් :

උතුරට : අංක WM/81/26 පිඹුරේ ලොට් 25, 24 ද,
නැගෙනහිරට : ලොට් 26 B ද,
දකුණට : අංක WM/81/26 පිඹුරේ ලොට් 27 ද,
බස්නාහිරට : නිවාස සංකීර්ණ පාර ද,

යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම පහයි හයක් (අ. 0, රූ. 0, පර්. 8.56) විශාල ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි සහ එයට අයිති සියලු දේද වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් කාර්යාලයේ සී 428/56 හි ලියාපදිංචි වී ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - ගම්පහ.

වර්ෂ 2017 ක් වූ පෙබරවාරි මස 06 වැනි දින දී ය.

03-732

## පිස්කල් විසින් කරනු ලබන ඉඩම් වෙන්දේසියක් බදුල්ල දිසා අධිකරණයේ දී ය

මහජන බැංකුව,
අංක 75,
ශ්‍රීමත් චිත්තප්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

නඩු අංකය : MB7570
ඇස්කිසි අංකය : 8/16

................................*පැමිණිලිකරු.*

*එදිරිව*

මහවත්තේ ආරච්චිගේ ධම්මිකා මල්කාන්ති,
අංක 50, පිලිපොතගම, පිංඅරාව, බදුල්ල.

..................................*විත්තිකාරිය.*

වර්ෂ 2016 ක් වූ අගෝස්තු මස 23 වැනි දී ය.

බදුල්ල දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් බදුල්ල දිසා අධිකරණයේ නියෝජ්‍ය පිස්කල් වෙත නිකුත් කරන ලද දේපල තහනමට ගෙන විකිණීමේ රිට් ආඥාව මත ඉහත විත්තිකරුගෙන් අයකර ගත යුතු රු. 2,058,691.91 ක මුදලත්, එකී දේපල වෙන්දේසි කිරීමේ ගාස්තුව අයකර ගැනීම සඳහාත් එකී නියෝජ්‍ය පිස්කල් විසින් තහනමට ගෙන ඇති පහත උපලේඛනයේ විස්තර වන බදුල්ල මහවෙලගම, මැදපතන, රිදීපාන වතුයායේ කොටසක් නමැති ප්‍රමාණයෙන් පර්චස් 32 ක් විශාල දේපල 2017 ක් වූ මාර්තු මස 31 වැනි දින පෙ.ව. 10.30 ට එකී දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපලට පිවිසෙන මාර්ගය.-* බදුල්ල මහියංගන පාරේ කි. මී. 3 ක් පමණ ගියවිට පාරේ දකුණු දෙසට හමුවන රිදීපානවත්ත පාරේ මීටර් 600 ක් පමණ ගිය විට හමුවන හංදියෙන් දකුණු දෙසට ඇති පාරේ මීටර් 700 කට ආසන්න දුරක් ගමන් කල යුතුයි. එතැන් සිට හමුවන දකුණු දෙසට විහිදෙන පාරට මායිම්ව හංදියේම හමුවන නිවස සහිත ඉඩමට (පිරිවෙන් ගුරුවරයෙකු වන නිමල් ප්‍රියන්ත මහතාගේ ඉඩම) පසුව හමුවන දෙවන ඉඩම අදාළ දේපල වේ.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් මුදල මා වෙත ගෙවිය යුතුය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කල යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැනුම් මිලෙන් සියයට විසිපහක (25%) මුදල (ඉතිරි සියයට හැත්තෑපහක (75%) නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කිරීමට දින තිහක (30) කාලයක් දෙනු ලැබේ.)

02. පිස්කල් ගාස්තු (සම්පූර්ණ ගැනුම් මිලෙන් මුල් රු. 7500 ට රු. 150 ක මුදලක් ද, ඉතිරි සෑම රු. 1,000 කට රු. 5 බැගින් සම්පූර්ණ මුදලම ගණනය කර ගෙවිය යුතු යි.)

මෙම දේපල රු. 1,625,000 කට තක්සේරු කර ඇති බැවින් වෙන්දේසියේ දී ලංසු තබා ඉල්ලීමට ඉදිරිපත්වන ගැනුම්කරුවන් වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථමයෙන් ඉහත සඳහන් 25%ක මුදල සඳහා අවම වශයෙන් රු. 406,250 ක මුදලක් මා වෙත ඉදිරිපත් කල යුතු ය. එසේ නොකරන අයට වෙන්දේසියේදී ලංසු තැබීමට අවසර දෙනු නොලැබේ.

### උපලේඛනය

01. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකිඳ කොටසේ, සොරණාතොට කෝරලේ, බදුල්ල මහ නගර සභා කඩවත් සතර තුළ, මහවෙලගම, මැදපතන ගමේ පිහිටි රිදීපාන වතුයායේ කොටසක් නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එෆ්. පුවාඩ් ස්මායිල් මහතා විසින් මැන සාදනලද අංක 1410 සහ 2007.01.02 වන දින දරන පිඹුරේ කැබලි අංක 03 ලෙස නිරූපිත බෙද වෙන් කල බිම් කොටසට මායිම්, උතුරට එම්. එෆ් පුවාඩ් ස්මයිල් මහතාගේ අංක 1410 සහ 2007.01.02 දින දරන පිඹුරේ කැබලි අංක 02 ලෙස නිරූපිත බිම් කොටසද, නැගෙනහිරට : එම්. එෆ් පුවාඩ් ස්මායිල් මහතාගේ අංක 1410 සහ 2007.01.02 දින දරන පිඹුරේ කැබලි අංක 02 ලෙස නිරූපිත බිම් කොටසද, දකුණට එම්. එෆ්. පුවාඩ් ස්මයිල් මහතාගේ අංක 1410 සහ 2007.01.02 දින දරන පිඹුරේ කැබලි අංක 04 ලෙස නිරූපිත බිම් කොටස, බස්නාහිරට : වතු පාර සහ අඩි 20 ක් පළල පාරට වෙන් කරන ලද බිම් කොටස ද

යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක (අක් 0, රූඩ් 0, පර්. 10) ක් විශාලත්වයෙන් යුතු බිම් කොටස සහ එකී බිම් කොටස තුල පිහිටි ගහකොල, පලතුරු ආදී සෑම සියලු දේත් සහ එම්. එෆ්. පුවාඩ් ස්මයිල් මිනින්දෝරු මහතාගේ අංක 1410 සහ 2007.01.02 දින දරන පිඹුරේ කැබලි අංක 02 ලෙස නිරූපිත අඩි 02 ක පළලින් යුත් කාණුව (කාණුවට වෙන් කර ඇති බිම් කොටස) සහ එකී පිඹුරේ කැබලි අංක 07 ලෙස නිරූපිත අඩි 03 ක පළලින් යුත් කාණුව (කාණුවට වෙන් කර ඇති බිම් තීරුව) පොදුවේ භුක්ති විඳීමේ අයිතිවාසිකම්ද සමඟ වේ.

මෙම ඉඩම බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 105/249 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

02. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකිඳ කොටසේ, සොරණාතොට කෝරලේ, බදුල්ල මහනගර සභා කඩවත් සතර තුල, මහවෙලගම, මැදපතන ගමේ පිහිටි රිදීපාන වතුයායේ කොටසක් නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එෆ්. පුවාඩ් ස්මායිල් මහතා විසින් මැන සාදන ලද අංක 1410 සහ 2007.01.02 වන දින දරන පිඹුරේ කැබලි අංක 04 ලෙස නිරූපිත බෙදා වෙන් කල බිම් කොටසට මායිම්, උතුරට එම්. එෆ්. පුවාඩ් ස්මයිල් මහතාගේ අංක 1410 සහ 2007.01.02 දින දරන පිඹුරේ කැබලි අංක 03 ලෙස නිරූපිත බිම් කොටසද, නැගෙනහිරට : එම්. එෆ්. පුවාඩ් ස්මයිල් මහතාගේ අංක 1410 සහ 2007.01.02 දින දරන පිඹුරේ කැබලි අංක 02 ලෙස නිරූපිත බිම් කොටසද, දකුණට : එම්. එෆ්. පුවාඩ් ස්මයිල් මහතාගේ අංක 1410 සහ 2007.01.02 දින දරන පිඹුරේ කැබලි අංක 05 ලෙස නිරූපිත බිම් කොටස, බස්නාහිරට : වතු පාර සහ අඩි 20 ක් පළල පාරට වෙන් කරන ලද බිම් කොටසද යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක (අක්. 0, රූ. 0, පර්. 10) ක් විශාලත්වයෙන් යුතු බිම් කොටස සහ එකී බිම් කොටස තුල පිහිටි ගහකොල, පලතුරු ආදී සෑම සියලු දේත් සහ එම්. එෆ්. පුවාඩ් ස්මයිල් මිනින්දෝරු මහතාගේ අංක 1410 සහ 2007.01.02 දින දරන පිඹුරේ කැබලි අංක 02 ලෙස නිරූපිත අඩි 02 ක පළලින් යුත් කාණුව (කාණුවට වෙන් කර ඇති බිම් කොටස) සහ එකී පිඹුරේ කැබලි අංක 07 ලෙස නිරූපිත අඩි 03 ක පළලින් යුත් කාණුව (කාණුවට වෙන් කර ඇති බිම් තීරුව) පොදුවේ භුක්ති විඳීමේ අයිතිවාසිකම්ද සමඟ වේ.

මෙම ඉඩම බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 105/250 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

03. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකිඳ කොටසේ, සොරණාතොට කෝරලේ, බදුල්ල මහනගර සභා කඩවත් සතර තුල, මහවෙලගම, මැදපතන ගමේ පිහිටි රිදීපාන වතුයායේ කොටසක් නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එෆ් පුවාඩ් ස්මායිල් මහතා විසින් මැන සාදන ලද අංක 1410 සහ 2007.01.02 වන දින දරන පිඹුරේ කැබලි අංක 05 ලෙස නිරූපිත බෙදා වෙන් කල බිම් කොටසට මායිම්, උතුරට : එම්. එෆ්. පුවාඩ් ස්මයිල් මහතාගේ අංක 1410 සහ 2007.01.02 දින දරන පිඹුරේ කැබලි අංක 04 ලෙස නිරූපිත බිම් කොටස ද, නැගෙනහිරට : එම්. එෆ්. පුවාඩ් ස්මයිල් මහතාගේ අංක 1410 සහ 2007.01.02 දින දරන පිඹුරේ කැබලි අංක 02 ලෙස නිරූපිත බිම් කොටස ද, දකුණට : එම්. එෆ්. පුවාඩ් ස්මයිල් මහතාගේ අංක 1410 සහ 2007.01.02 දින දරන පිඹුරේ කැබලි අංක 06 ලෙස නිරූපිත බිම් කොටස, බස්නාහිරට : වතු පාර සහ අඩි 20 ක් පළල පාරට වෙන්කරන ලද බිම් කොටසද යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහක (අක්. 0, රූඩ් 0, පර්. 12) ක් විශාලත්වයෙන් යුතු බිම් කොටස සහ එකී බිම් කොටස තුල පිහිටි ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේත් සහ එම්. එෆ්. පුවාඩ් ස්මයිල් මිනින්දෝරු මහතාගේ අංක 1410 සහ 2007.01.02 දින දරන පිඹුරේ කැබලි අංක 02 ලෙස නිරූපිත අඩි 02 ක පළලින් යුත් කාණුව (කාණුවට වෙන් කර ඇති බිම් කොටස) සහ එකී පිඹුරේ කැබලි අංක 07 ලෙස නිරූපිත අඩි 03 ක පළලින් යුත් කාණුව (කාණුවට වෙන් කර ඇති බිම් තීරුව) පොදුවේ භුක්ති විඳීමේ අයිතිවාසිකම්ද සමඟ වේ.

මෙම ඉඩම බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ ඒ 105/251 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

*අයිතිය පිළිබඳ විමසීමට :*

කළමනාකරු, මහජන බැංකුව, බදුල්ල - දුරකථන අංක : 055-2222288

පැමිණිලිකරුගේ නීතිඥ ධනුෂ්ක වැලිගම මහතා - දුරකථන අංක : 055-2230128

රෙජිස්ට්‍රාර් නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - බදුල්ල.

03-786

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

### ගම්පහ දිසා අධිකරණයේ දී ය

සංශෝධිත පරිදි වූ 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සහ ඊට අනුකූල නෛසයි තීන්දු ප්‍රකාශයක් සහ නියත තීන්දු ප්‍රකාශයක් සඳහා ඉල්ලීම පිළිබඳ කාරණයේ දී ය.

ගම්පහ දිසා අධිකරණයේ
නඩු අංක : 08/DR
ස්වාභාවය : ඩී. ආර්.
කාර්ය පටිපාටිය : ලඝු
වටිනාකම : රු. 10,000,000
ගම්පහ දිසා අධිකරණයේ
ඇස්කීසි අංක : 117/2016

කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 479 (කලින් අංක 481) දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ දෙල්ගොඩ බියගම පාරේ අංක 351/එෆ් හි ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන හැටන් නැෂනල් බෑංක් පීඑල්සී (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

.................................*පැමිණිලිකරු.*

*එදිරිව*

මුණසිංහ ආරච්චිගේ සිසිර සුලෝචන මුණසිංහ,
අංක 208/2,
බටලන්ද පාර,
මාකොළ දකුණ,
මාකොළ.

..........................................*විත්තිකරු.*

ඉහත අංක සඳහන් නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කිසීයට අනුව පහත උපලේඛනයේ සඳහන් දේපල 2016.11.07 වැනි දින මා විසින් තහනම් කිරීමෙන් පසු ඉහත නම් සඳහන් විත්තිකරු විසින් නෛසයි තීන්දු ප්‍රකාශිත මුදල පැමිණිලිකරු බැංකුවට ගෙවීම පැහැර හැර ඇති හෙයින් රුපියල් 1,079,270.61 ක මුදලක් සහ 2014 මාර්තු මස 06 වන දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් ඒ සඳහා සියයට පහළොව (15%) බැගින් වාර්ෂික පොලිය ද සහ ණය මුදල සහ එම මුදල මත 2014 මාර්තු මස 06 වන දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් සියයට පහළව (15%) බැගින් එකතු කල විට ලැබෙන මුළු මුදල ගෙවා අවසන් වන තෙක් මුළු මුදල මත නෛතික පොලිය ද සමඟ ගෙවන ලෙස, රු. 3,633,972.35 ක මුදලක් සහ 2014 මාර්තු මස 06 වන දින සිට ඒ සඳහා සියයට දාහතර (14%) බැගින් වූ වාර්ෂික පොලිය ද ණය මුදල සහ එම මුදල මත 2014 මාර්තු මස 06 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් සියයට දාහතරක් (14%) බැගින් එකතු කළ විට ලැබෙන මුළු මුදල ගෙවා අවසන් වන තෙක් එම මුදල මත නෛතික පොලිය ද සමඟ ගෙවන ලෙස රු. 2,645,968.01 ක මුදලක් සහ 2014 මාර්තු මස 06 වන දින සිට ඒ සඳහා සියයට දහසය (16%) බැගින් වූ වාර්ෂික පොලිය ද ණය මුදල සහ එම මුදල මත 2014 මාර්තු මස 06 වන දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් සියයට දහසය (16%) බැගින් එකතු කළ විට ලැබෙන මුළු මුදල ගෙවා අවසන් වන තෙක් මුළු මුදල මත නෛතික පොලිය ද සමඟ ගෙවන ලෙස, රු.1,896,659,03 ක මුදලක් සහ 2014 මාර්තු මස 06 වන දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් ඒ සඳහා සියයට දහසය (16%) බැගින් වාර්ෂික පොලිය ද ණය මුදල සහ එම මුදල මත 2014 මාර්තු 06 වන දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් සියයට දහසය (16%) බැගින් එකතු කළ විට ලැබෙන මුළු මුදල ගෙවා අවසන් වන තෙක් මුළු මුදල මත නෛතික පොලියද සමඟ ගෙවන ලෙසද සහ නඩු ගාස්තු ද විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට තීරණය කර ඇති අතර, එකී ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති හෙයින්, ගම්පහ දිසා අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රය පිට මා විසින් 2016.11.07 වැනි දින තහනමට ගෙන ඇති විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරාමත්කව සඳහන්ව ඇති නිශ්චල දේපල වර්ෂ 2017 ක් වූ මැයි මස 12 වැනි දින පෙ.ව. 11.00 ට විත්තිකරුගේ දේපල පිහිටි ස්ථානයේදී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහලම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් සියයට විසි පහක් (25%) මුදලක් ද පිස්කල් ගාස්තු රජයට අය විය යුතු ගාස්තු, තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු, *ගැසට් පත්‍රයේ* සහ පුවත් පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් එවලේම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාර ගනු නොලැබේ. ගැනුම් මිලෙන් සියයට හැත්තෑ පහක (75%) ඉතිරි මුදල දින 30 ක් ඇතුලත ගම්පහ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

*දේපල පිහිටි ස්ථානයට ප්‍රවේශවන මාර්ගය :*

කිරිබත්ගොඩ නගරයේ සිට මාකොළ පාරේ කි. මී. 2 1/2 ක් පමණ ඉදිරියට ගොස් මාකොළ හන්දියෙන් වමට හැරී උඩුපිල පාරේ කි. මී. 1 කණුව ඉදිරියෙන් ඇති අඩි 10 ක් පමණ පළල පාරේ මීටර් 50 ක් පමණ ඉදිරියට ගිය පසු වම්පස මෙම දේපළ පිහිටා ඇත.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අදිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය සභාවේ මාකොළ උපකාර්යාල සීමාව ඇතුළත මාකොළ ගමෙහි පිහිටි මාවරමණ්ඩිය පාරේ වරිපනම් අංක 250/4 දරන පණුගල් ගොඩ ලන්ද නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක ජී. එම්. කේ. පෙරේරා විසින් දින පිඹුරුපත් අංක 60/208 යටතේ 2008.02.09 වන දින වඩාත් නිවැරදි ලෙස 2008.02.20 වන දින මැන බෙදා වෙන්කර සකස් කර කැබලි අංක 11B/6 වශයෙන් ලකුණු කරන ලද ඉඩමට උතුරින් : කැබලි අංක 11B/7 සහ 11B/5 මගින් ද, නැගෙනහිරට බලයලත් මානක පී. ජයකොඩි විසින් සකස් කරන ලද පිඹුරුපත් අංක 1557 හි සඳහන් කැබලි අංක 12න් ද, දකුණට - එකී පිඹුරුපත් අංක 1558 හි සඳහන් කැබලි අංක 08 න් ද, සහ බස්නාහිරට කැබලි අංක 11B/7 න් ද මායිම් වූ එකී පිඹුරුපත් අංක 60/2008 ට අනුව පර්චස් දොළහයි දශම අටයි බින්දුවකින් සමන්විත ඉඩම (අක්, 0 රූ. 0 පර්. 12.80) ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්ඉරු අංක C 868/67 හි ලියාපදිංචි කර ඇත සහ මාර්ග අයිතිය C 918/36 හි ලියාපදිංචි කර ඇත.

ඒ. එච්. අදිකාරි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ගම්පහ.

වර්ෂ 2017 ක් වූ මාර්තු මස 02 වැනි දින දී ය.

03-822/1

---

**පිස්කල් වෙන්දේසියේ විකිණීමයි**

ගම්පහ දිසා අධිකරණයේ දී ය

ගම්පහ දිසා අධිකරණයේ
නඩු අංකය : 08/ඩීආර්,
ස්වාභාවය : ඩී. ආර්.
කාර්ය පටිපාටිය : ලඝු
වටිනාකම : රු. 10,000,000
ගම්පහ දිසා අධිකරණයේ
ඇස්කීසි අංක : 117/2016

සංශෝධිත පරිදි වූ 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සහ ඊට අනුකූල නෛසයි තීන්දු ප්‍රකාශයක් සහ නියත තීන්දු ප්‍රකාශයක් සඳහා ඉල්ලීම පිළිබඳ කාරණයේ දී ය.

කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 479 (කලින් අංක 481) දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ දෙල්ගොඩ බියගම පාරේ අංක 351/**F** හි ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන හැටන් නැෂනල් බැංක් පී.එල්.සී. (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

....................................*පැමිණිලිකරු.*

*එදිරිව*

මුණසිංහ ආරච්චිගේ සිසිර සුලෝචන මුණසිංහ
අංක 208/2, බටලන්ද පාර,
මාකොළ දකුණ,
මාකොළ.

........................................*විත්තිකරු.*

ඉහත අංක සඳහන් නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියට අනුව පහත උපලේඛනයේ සඳහන් දේපල 2016.11.07 වැනි දින මා විසින් තහනම් කිරීමෙන් පසු ඉහත නම් සඳහන් විත්තිකරු විසින් නෛසයි තීන්දු ප්‍රකාශිත මුදල පැමිණිලිකාර බැංකුවට ගෙවීම පැහැර ඇති හෙයින් රුපියල් 1,079,270.61 ක මුදලක් සහ 2014 මාර්තු මස 06 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් ඒ සඳහා සියයට පහළව (15%) බැගින් වාර්ෂික පොලිය ද සහ ණය මුදල සහ එම මුදල මත 2014 මාර්තු මස 06 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් සියයට පහළව (15%) බැගින් එකතු කල විට ලැබෙන මුළු මුදල ගෙවා අවසන් වන තෙක් මුළු මුදල මත නෛතික පොලිය ද සමග ගෙවන ලෙස රු. 3,633,972.35 ක මුදලක් සහ 2014 මාර්තු මස 06 වැනි දින සිට ඒ සඳහා සියයට දාහතරක (14%) බැගින් වූ වාර්ෂික පොලියද ණය මුදල සහ එම මුදල මත 2014 මාර්තු මස 06 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් සියයට ද ාහතරක (14%) බැගින් එකතු කල විට ලැබෙන මුළු මුදල ගෙවා අවසන් වන තෙක් එම මුදල මත නෛතික පොලිය ද සමග ගෙවන ලෙස රු. 2,645,968.01 ක මුදලක් සහ 2014 මාර්තු මස 06 වැනි දින සිට ඒ සඳහා සියයට දසයක (16%) බැගින් වූ වාර්ෂික පොලිය ද ණය මුදල සහ එම මුදල මත 2014 මාර්තු මස 06 වන දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් සියයට දාසයක (16%) බැගින් එකතු කළ විට ලැබෙන මුළු මුදල ගෙවා අවසන් වැනි තෙක් මුළු මුදල මත නෛතික පොලිය ද සමග ගෙවන ලෙස, රු. 1,896,659.03 ක මුදලක් සහ 2014 මාර්තු මස 06 වන දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් ඒ සඳහා සියයට දාසයක (16%) බැගින් වාර්ෂික පොලිය ද ණය මුදල සහ එම මුදල මත 2014 මාර්තු මස 06 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය තෙක් සියයට දාසයක (16%) බැගින් එකතු කළ විට ලැබෙන මුළු මුදල ගෙවා අවසන් වන තෙක් මුළු මුදල මත නෛතික පොලිය ද සමග ගෙවන ලෙස ද සහ නඩු ගාස්තු ද විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට තීරණය කර ඇති අතර, එකී ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති හෙයින්, ගම්පහ දිසා අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රය පිට මා විසින් 2016.11.07 වැනි දින තහනමට ගෙන ඇති විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරාත්මකව සඳහන්ව ඇති නිශ්චල දේපල වර්ෂ 2017 ක් වූ මැයි මස 12 වැනි දින ප.ව. 1.30 ට විත්තිකරුගේ දේපල පිහිටි ස්ථානයේදී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් සියයට විසි පහක් (25%) මුදලක් ද පිස්කල් ගාස්තු රජයට අයවිය යුතු ගාස්තු තක්සේරු ගාස්තු වෙන්දේසි ගාස්තු *ගැසට් පත්‍රයේ* සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් එවලේම මුදලින් මා වෙත ගෙවිය යුතු ය. චෙක් පත් භාරගනු නොලැබේ. ගැනුම් මිලෙන් සියයට හැත්තෑ පහක (75%) ඉතිරි මුදල දින 30 ක් ඇතුළත ගම්පහ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කල යුතු ය.

*දේපල පිහිටි ස්ථානයට ප්‍රවේශ වන මාර්ගය :*

දෙල්ගොඩ නගරයේ සිට මාකොළ දක්වා ඇති පාරේ මාවරමණ්ඩිය නගරයෙන් දකුණට ඇති පාරේ මීටර් 100 ක් පමණ ඉදිරියට ගිය පසු මෙම ඉඩම පාරේ දකුණු පස පිහිටා ඇත.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ අදිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය සභාවේ කඩවත උපකාර්යාල සීමාව ඇතුළත ඉහල බියන්විල පිහිටි මදටිය ගහ වත්ත හෙවත් මිල්ලගහ වත්ත නමින් හඳුන්වන ඉඩමේ පිහිටි ගොඩනැගිලි සහ අනිකුත් දේ ඇතුලුව බලයලත් මානක එම්. එස්. ප්‍රනාන්දු විසින් 1969.04.18 වැනි දින පිඹුරුපත් අංක 2625 යටතේ මැන බෙදා වෙන් කර කැබලි අංක 07 වශයෙන් ලකුණු කරන ලද ඉඩමට උතුරින් - කැබලි අංක 06න් ද, නැගෙනහිරට - කැබලි අංක 09 න් ද, දකුණට - කැබලි අංක 08න් ද, බස්නාහිරට - කැබලි අංක 03 න් ද මායිම් වූ එකී පිඹුරුපත් අංක 2625 අනුව පර්චස් විස්සකින් සමන්විත ඉඩම (අක්. 0, රූ. 0, පර්. 20) ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඉත්ඉරු අංක C 833/232 හි ලියාපදිංචි කර ඇත.

ඒ. එච්. අදිකාරී,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ගම්පහ.

වර්ෂ 2017 ක් වූ මාර්තු මස 02 වැනි දින දී ය.

03-822/2

# නොතාරිස් ලැයිස්තුව

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනත 11 වැනි වගන්තිය යටතේ, ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

01. කොච්චිකඩේ, දකුණු වැලිහේන, අංක 418/ඒ හි පදිංචි, ලියනගේ දෝන ඉරාන්ති මධූෂා නානායක්කාර මහත්මිය මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

02. ගම්පහ, පෙතියාගොඩ, අංක 119/06 හි පදිංචි, හේවා එදිරිමාන්නගේ අනෝජා සිංහමාලි මහත්මිය ගම්පහ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්.

නීල් ද අල්විස්,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2016 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

03-828/1

---

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනත 11 වැනි වගන්තිය යටතේ, ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

01. අංගොඩ, හිඹුටාන, අංක 123/සී හි පදිංචි, දෝන චතුරිකා රංගනී ජයසිංහ මහත්මිය කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

02. බොරලැස්ගමුව, පොකුණ මාවත, අංක 2 හි පදිංචි, ටාන්යා ඩිලානි විමල ගුණසේකර මහත්මිය කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

03. දෙහිවල, කළුබෝවිල, කින්දවත්ත මහල් නිවාසය, අංක ඒ/2/3 හි පදිංචි, මරියා රොෂෙල් නතාලි අලහකෝන් මෙනවිය කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

04. බත්තරමුල්ල, කොස්වත්ත, පයිප්ප පාර, ප්‍රසන්න මාවත, අංක 384/4/2 හි පදිංචි, කන්කානි තන්තිරි අභයප්‍රිය රුවන් ද සිල්වා මහතා කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්.

නීල් ද අල්විස්,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2016 දෙසැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

03-828/2

---

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 03 වන වගන්තිය යටතේ, ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(01) බත්තරමුල්ල, දකුණු තලංගම, අකුරෙගොඩ, වැව පාර, අංක 452/1 හි පදිංචි, ජාසිංහගේ දොන් ඩග්ලස් මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,

(02) ගාල්ල, බෝපේ, සපුමල් පෙදෙස පාර, අංක 45/2 හි පදිංචි, දෙහිගස්පේ රණවකගේ නිශාන් දේවින්ද රණවක මහතා, ගාල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,

(03) තංගල්ල, මුහුදු මාවත, අංක 162 හි පදිංචි, ඩිලාන් මහේෂ් ජයසිංහ මහතා, තංගල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,

(04) කුරුණෑගල, ගංගොඩ පාර, අංක 96 හි පදිංචි, චන්ද්‍රසේකර මුදියන්සේලාගේ පුබුදු ජානක චන්ද්‍රසේකර මහතා, කුරුණෑගල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,

(05) කොහුවල, ග්‍රීන්පාත්, අංක 25 ඒ හි පදිංචි, මේරිඇන් නඩීන් පුවිමානසිංහ මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(06) පේරාදෙණිය, මීවතුර, අංක 342 ඒ හි පදිංචි, ප්‍රසාදිනී මහේෂිකා දරාඔකුඹුර මහත්මිය, මහනුවර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(07) පොලොන්නරුව, ඕනෑගම, අංක 17/28 හි පදිංචි, රණසිංහ ආරච්චිලාගේ රවින්ද්‍ර රණසිංහ මහතා, පොලොන්නරුව අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,

(08) කොළඹ 03, මොහමඩ් මාකන් මාකර් මාවත, අංක 32 ඒ හි පදිංචි, උත්තරා චේතනී හේවගේ මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(09) වත්තල, හැඳල, මුණමල්ගහවත්ත පාර, අංක 366/16 හි පදිංචි, කුරුප්පු ආරච්චිගේ දෝන උදේශිකා චතුරාණි මහත්මිය, ගම්පහ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(10) බාඳුරාගොඩ, වත්තේමුල්ල, අංක 48/1 හි පදිංචි, මාවත්තේ විදානෙලාගේ උදාරි මනේෂා මාවත්ත මහත්මිය, මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්.

නීල් ද අල්විස්,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2017 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ 07.

03-483/1

---

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 03 වන වගන්තිය යටතේ, ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(01) කොළඹ 12, වේල්ල වීදිය, අංක 282/3 හි පදිංචි, වික්‍රමසිංහ රාජපක්ෂ වාසල මුදියන්සේලාගේ අනුරාධි ඉරන්තිකා වික්‍රමසිංහ මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(02) කොළඹ 06, කිරුළපන, හයිලෙවල් පාර, අංක 250/34 හි පදිංචි, විග්නේස්වරන් මාතිනි මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(03) නුගේගොඩ, කන්දවත්ත පාර, අංක 82 හි පදිංචි, තුහාෂිනි ඩිමිත්‍රි ගුණතිලක මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(04) මොරටුව, ප්‍රනාන්දු පෙදෙස, අංක 32 හි පදිංචි, ගෝනියමාලිමිගේ රුවංගි චේතනා අපෝන්සු මහත්මිය, පානදුර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(05) කොළඹ 05, විජය කුමාරතුංග මාවත, දේවිකා උද්‍යාන පාර, අංක 142/12 හි පදිංචි, සහන් ගයාශ්‍රී කුලතුංග මහතා, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයෙකු වශයෙන්,

(06) කොළඹ 03, කාමල් පාර, අංක 58 හි පදිංචි, රණසිංහ ආරච්චිගේ දිනුෂි තාරකා විජේවර්ධන මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(07) දෙහිවල, කළුබෝවිල, කඩවත පාර, අංක 27/2 හි පදිංචි, අංජලි අරෝෂා අමරසිංහ මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(08) රත්මලාන, නව ගුවන් තොටුපල පාර, අංක 28 හි පදිංචි, මිල්ලපටබැඳිගේ සමන්ති ලක්මාලි ඩයස් මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(09) රත්මලාන, කාෂියා මාවත, අංක 9බී හි පදිංචි, මහීකා මධුභාෂිණී රණවීර මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(10) කෑගල්ල, ධර්මපාල මාවත, අංක 88 හි පදිංචි, සුභවීර ගමගේ චතුර්ණික කෙශාන්ග පෙරේරා මහතා, කෑගල්ල අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,

(11) තම්බිලුවිල් 02, තම්බිලුවිල් මධ්‍ය මහා විද්‍යාලය ඉදිරිපස පාර හි පදිංචි, සංගමන් ශසිරාජ් මහතා, කල්මුණේ අධිකරණ කලාපය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්.

නීල් ද අල්විස්,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2017 පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ 07.

03-483/2

---

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 03 වන වගන්තිය යටතේ, ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර තිබේ :

(01) පෝරුවදණ්ඩ, රත්මල්ගොඩ, ශ්‍රී ධීරානන්ද මාවත හි පදිංචි අත්තනායක ආරච්චිගේ අයේෂා කුමාරි මෙනෙවිය, පානදුර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(02) කොළඹ 12, අළුත්කඩේ වීදිය, අංක 192 හි පදිංචි හේනක රාළලාගේ ඉරේෂා බාලසූරිය දයානන්ද මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(03) රුවන්වැල්ල, කන්නත්තොට, මත්තමගොඩ හි පදිංචි අතාවුදගේ රුවන් තුසිත කුමාර මහතා, කෑගල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,

(04) අනුරාධපුරය, වහමල්ගොල්ලෑව, ඉක්කිරිගොල්ලෑව, ප්‍රධාන පාර හි පදිංචි මොහමඩ් අබ්දුල් රහීම් ෆාතිමා රුෂ්ද මහත්මිය, අනුරාධපුරය අධිකරණ කලාපය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(05) වැල්ලවත්ත, ගාලු පාර, අංක 549/5 හි පදිංචි තියාගි හෙප්සිබා පියදාස මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(06) කොළඹ 12, අළුත්කඩේ, වෙල්ල වීදිය, අංක 282/4, 5 සහ 6 හි පදිංචි වික්ටර් පැට්‍රික් මැතිව් ඇලනා රීත් මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(07) මොරටුව, ගොලුමඩම හංදිය, ගාලු පාර, අංක 12/2 බී හි පදිංචි, අලගියාදුර කුවින්ටස් රෙක්සි ප්‍රනාන්දු මහතා, පානදුර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරයකු වශයෙන්,

(08) ගම්පොල, කන්දේ වීදිය, අංක 23 හි පදිංචි බජ්ජම කංකානම්ගේ තිලංකා දිෂානි මහත්මිය, මහනුවර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(09) කොළොන්නාව, ටෙරන්ස් එන් ද සිල්වා මාවත, අංක 13/බී හි පදිංචි නම්බුකාරවසං මහසරංගුහේවගේ නිලංකා ලක්මාලි මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(10) මීගමුව, කුඩාපාඩුව, ලුවිස් පෙදෙස, අංක 246/2 හි පදිංචි අලුත්ගමගේ මැණික් චන්ද්‍රිකා මහත්මිය, මීගමුව අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්.

නීල් ද අල්විස්,
ලේකම්,
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2017 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ 07.

03-483/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.